# වැවිලි අමාත්‍යාංශය
# ශ්‍රී ලංකා තේ පර්යේෂණ ආයතනය
# තේ පර්යේෂණ මණ්ඩලය

## වතු අධිකාරී තනතුර (කොන්ත්‍රාත් පදනමින්)
## ශාන්ත ජෝකිම් වතුයාය, රත්නපුර.

ඉහත සඳහන් තනතුර පිරවීම සඳහා ශ්‍රී ලාංකික පුරවැසියන් වෙතින් අයදුම්පත් කැඳවනු ලැබේ.

ශ්‍රී ලංකා තේ පර්යේෂණ ආයතනය යටතේ රත්නපුර පිහිටි ශාන්ත ජෝකිම් වතුයායේ හා කර්මාන්තශාලාවේ වතු අධිකාරී ලෙස කටයුතු කරමින්, ඉතා ඉහළ සුදුසුකම්ලත් විද්‍යාඥයන් කණ්ඩායමක් සමග අභියෝගාත්මක පරිසරයක කටයුතු කිරීම සඳහා,ක්‍රියාශීලී වැවිලිකරුවකුගේ සේවය අවශ්‍යව ඇත.

සුදුසුකම්ලත් අයෙකු හට තම රැකියාව වැඩි වර්ධනය කරගනිමින් හා තේ කර්මාන්තයේ පිළිගැනීමට ලක්වෙමින් සහ තේ පර්යේෂණ ආයතනයේ විද්‍යාඥයන් සමග එකට කටයුතු කිරීම මගින් අනගි අවස්ථාවක් උදාකර ගත හැක.

**රැකියා විස්තරය :**

තේ කර්මාන්තශාලාවේ තේ වතුයායේ හා කාර්යාලයේ කටයුතු සැලසුම් කරමින්, සම්බන්ධීකරණය කරමින් හා සියලු කාර්යයන් අධීක්ෂණය කරමින් කටයුතු කිරීමේ වගකීම දරන අතර, උපචිත තොරතුරු කළමනාකාරිත්වය වෙත ලබාදීම කළ යුතුය.

**අධ්‍යාපනික සුදුසුකම් හා පළපුරුද්ද :**

අ.පො.ස. (සා/පෙළ) විභාගය, භාෂාව (සිංහල/ දෙමළ), ඉංග්‍රීසි හා ගණිතය විෂයයන් ඇතුළත්ව විෂයයන් හතරකට (04) සම්මාන සාමාර්ථ සහිතව විෂයයන් හයකින් (06) එක් වරකදී සමත්වීම.

**සහ**

අ.පො.ස. (උ/පෙළ) විභාගය, (පොදු ප්‍රශ්න පත්‍රය හැර) විෂයයන් තුනකින් (03) සමත්වීම.

**හෝ**

තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් තාක්ෂණ/වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කළ ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) 05 තලයට නොඅඩු වැවිලි කළමනාකරණ ඩිප්ලෝමා ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

අයදුම්කරු හට පහතරට තේ වත්තක හා කර්මාන්තශාලාවක වතුඅධිකාරී තනතුරක් දරමින් අවම වසර තුනක (03) වැවිලි පළපුරුද්ද තිබිය යුතු අතර, මිලට ගත් දළු කර්මාන්තශාලා මෙහෙයුම් සම්බන්ධ (Bought Leaf) පළපුරුද්ද ද අවශ්‍ය වේ.

විශිෂ්ට අන්තර් පුද්ගල සබඳතා, කණ්ඩායම් හැසිරීම හා ජාලකරණ කුසලතා තිබීම අමතර සුදුසුකම් වේ.

සිංහල හා ඉංග්‍රීසි භාෂා කාරක දැනුම තිබීම හා දෙමළ භාෂාවෙන් කතා කිරීමේ හැකියාව වැදගත් වේ.

මෙම පත්වීම කොන්ත්‍රාත් පදනම මත වන අතර මූලිකව වසර 03 සඳහා වාර්ෂිකව අලුත් කිරීමේ පදනම මතවේ.

**වයස :** අවුරුදු 70 ට අඩුවීම අපේක්ෂා කෙරේ.

**වැටුප් ගෙවීම :**

සියලු දීමනා ඇතුළත්ව මාසික පැකේජය දළ වශයෙන් රුපියල් 150,000/- වේ.

තෝරාගත් අයදුම්කරු හට, තේ පර්යේෂණ ආයතනයේ නිර්දිෂ්ඨ පරිදි මෙම තනතුරට අදාළ අමතර පහසුකම්ද හිමිවේ.

සම්පූර්ණ ජීව දත්ත ඇතුළත්ව අයදුම්පත, උප්පැන්න සහතිකයේ පිටපතක්, අදාළ අධ්‍යාපනික හා අනෙකුත් වෘත්තීය සුදුසුකම් සහතිකවල පිටපත්, සේවා සහතික හා අයදුම්කරුගේ අදාළ ක්ෂේත්‍රයේ දැනුම හා කුසලතා තක්සේරු කර බැලීම සඳහා ඥාති නොවන නිර්දේශකයන් දෙදෙනෙකුගේ නම් හා ලිපිනයන් සමග ලියාපදිංචි තැපැලෙන්, පහත සඳහන් අය වෙත, 2022 ජූලි 19 දිනට පෙර ලැබීමට සැලැස්විය යුතුය.

රාජ්‍ය සේවයේ/ සංස්ථාවල/ ව්‍යවස්ථාපිත මණ්ඩලවල නිලධාරීන් තම අයදුම්පත් අදාළ ආයතන ප්‍රධානී මාර්ගයෙන් එවිය යුතුය. මෙම අවශ්‍යතාවට අනුකූල නොවන ලෙස ඉදිරිපත් කරනු ලබන අයදුම්පත් ප්‍රතික්ෂේප වීමට අවකාශ ඇත. අදාළ කවරයේ වම් ඉහළ කෙළවරේ, අයදුම් කරනු ලබන තනතුර සඳහන් කළ යුතුය.

**අධ්‍යක්ෂ,**
**ශ්‍රී ලංකා තේ පර්යේෂණ ආයතනය,**
**ශාන්ත කූම්බස්,**
**තලවාකැලේ.**